# සප්ත තන්ත්‍රී වීණා කැටයම් හා පිටල්කොරා බෞද්ධ ගුහා

චන්දන රුවන් කුමාර

This paper examines the characteristics and the significance of the *veena* depicted in the engravings of the Pitalkhora Buddhist cave Temple at Aurangabad, Maharashtra. *Veena* is depicted in a variety of forms in Indian art, architecture and literature as a symbol of Hindu and Buddhist iconography. In Pitalkhora stone engravings, three *veenas* with seven strings *(sapta tantric veenas)* can be seen. These *veenas* are similar to a bow or a harp and are different from the *veenas* depicted at other locations. Further, they closely resemble the shape of the harp found from Egypt, Mesapotemia, Persia, Greece and Rome. However, it does not appear to have influenced the form of *veena* in Hindu practices. The *veena* of Pitalkhora has its own concept conjoined with Buddhism and the shape of the harp seems to have been influenced from ancient Greek, Roman, Egyptian, Mesopotamian and Persian harps.

© චන්දන රුවන් කුමාර

සංස්. ජයමල් ද සිල්වා, දිල්ශාන් මනෝජ් රාජපක්ෂ, දුලන්කා ලංසකාර, දිනේෂ් සඳරුවන්
'ප්‍රභා' ශාස්ත්‍රීය සංග්‍රහය, තුන් වැනි කලාපය - 2013/2014
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

ඉන්දියාවේ මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයට අයත් අවුරන්ගාබාද් දිස්ත්‍රික්කයේ සත්මාලා කඳු වැටියේ උත්තර දාරයේ පිටල්කොරා බෞද්ධ ගුහා පිහිටා ඇත. අජන්තා ගුහාවලට සැතපුම් 50ක් නිරිත දිගින් ද, එල්ලොරා ගුහාවලට සැතැපුම් 23ක් වයඹ දිගින් ද පිහිටා ඇති මේ පිටල්කොරා ගුහා ක්‍රි.පූ. පළමු වැනි සියවසේ පමණ ප්‍රතිෂ්ඨාපනය වූ බව පුරාවිද්‍යා මූලාශ්‍රය පෙන්වා දෙයි.[1] පිටල්කොරා ගුහා අංක 04හි සප්ත තන්ත්‍රී වීණා (Seven Strings Veena) සහිත කැටයම් තුනක් හඳුනාගෙන තිබේ. මේ ශෛලමය කැටයම් අතරින් පළමු වැන්න කාන්තාවක හා පුරුෂයකු සහිත කැටයමකි. ඒ කාන්තාව තත් හතේ වීණාව තම දකුණ'තින් වයයි. ඒ වීණාව ඊජිප්තු හා(ර්)ප් (Egyptian Harp) නැමැති තන්ත්‍ර වාද්‍යයට සමාන ය. කාන්තාව තම උකුළේ රඳවාගත් ඒ වීණාව කෝණ (Plectrum) නැමැති උපකරණය තම මහපටැඟිල්ලෙහි රඳවාගෙන ඉන් වීණාවේ දෙ වැනි තත වයයි. පිටල්කොරා ගුහා අංක හතරෙහි හමු වන දෙ වැනි කැටයම තරුණයකු තම උරහිසට සිටින සේ රඳවාගත් සප්ත තන්ත්‍රී වීණාවක් සහිත කැටයමකි. ඒ වීණාව ඉලිප්සාකාර (elliptical) හැඩයකින් යුතු බඳකින් සමන්විත වේ. ඒ බඳට සවි කළ අර්ධ වක්‍රාකාර හැඩලයකින් (දණ්ඩ) තත් තද ව සවි කර ඇත.

තුන් වැන්න ද පුරුෂයකුගේ කැටයමකි. ඔහුගේ වම් බාහුව මත සප්ත තන්ත්‍රී වීණාවකි. ඔහු තම දකුණතෙහි කෝණය (Plectrum) රඳවාගෙන සිටියි.

විවිධ ආකෘතියේ වීණා සහිත සිතුවම් හා ශෛලමය පුවරුවල කළ කැටයම් ඉන්දියාවේ ප්‍රාචීන කාල ගුහාශ්‍රිත සිද්ධස්ථානවලින් හමු වී ඇත. අජන්තා, භාරුත්, අමරාවතී, සාංචි, නාගර්ජුනකොණ්ඩ, මහාවල්ලිපුරම්, චිදාම්වරම්, භුවනේස්වර, ගාන්ධාර, බරබුදුර්, බාගීලී - කාලේස්වර (බෙංගාල්) වැනි ස්ථාන ඒ අතර සුවිශේෂ වේ. ක්‍රි.පූ. දෙ වැනි සිය වසට පමණ අයත් පැරැණි භාරුත් ස්තූප වීණා හා ඊට සම කාලීන අජන්තා වීණා ක්‍රි.පූ. සිවු වැනි සිය වසට අයත් සමුද්‍රගුප්ත අධිරාජ්‍ය සමයේ තිබූ බවට සැලැකෙන කාසිවල ඇඳ ඇති වීණා රූප ආකෘතියෙන් බෝවක හැඩය (Bow – type – අර්ධ වක්‍රාකාර;

දුන්නක් වැනි) ගනී. ගාන්ධාර හා අමරාවතී වීණා (ක්‍රි.පූ. 1 - 2) ආකෘතිය අජන්තා හා භාරුත් වීණා ආකෘතියට වඩා වෙනස් ය. ඒවා වර්තමාන සරෝද් නැමැති තත් වාද්‍යයට සමාන හැඩයක් ගන්නා අතර තත් තුනකින් හෝ හතරකින් සමන්විත වේ. මේ සරෝද් ස්වරූපයේ පුරාණ වීණා ඉන්දියාවේ නාගර්ජුනකොණ්ඩ නැමැති ස්ථානයේ ද චීනයේ හා මධ්‍යම ආසියාතික මෙන් ම නැගෙනහිර ආසියාවේ ඇතැම් කලාපවලින් ද (Tunhand, Quizil, Turfan, Champa, Bazakilk, Madagascar) හමු වී ඇත. මහාවල්ලිපුරම් (ක්‍රි.පූ. 7) හා බෙංගාලයේ ඇතැම් ස්ථානවලින් (ක්‍රි.පූ. 9 - 14) සොයාගෙන ඇති වීණා ආකෘතිය ඉහත සියලු ම ආකෘතිවලට වඩා වෙනස් ය. තුම්බා දෙකකින් සමන්විත ඒ වීණා 'සරස්වතී වීණා' නමින් හැඳින්වේ. ඒ වර්ගයේ වීණා සහිත කැටයම් චිදාරම්බරම්හි ද හමු වේ. අද්‍යතන යුගයේ දකුණු භාරතීය වීණාව මේ තුම්බා සහිත පුරාණ වීණාවේ විකාසනයක් බව අනුමාන කළ හැකි ය.

පිටල්කොරා සප්ත තන්ත්‍රී වීණාව ආකෘතියෙන් පැරැණි ඊජිප්තු, පර්සියා හා(ර්)ප් (Harp) නැමැති තන්ත්‍ර වාද්‍යයට සමාන ය. එවැනි හැඩයේ වීණාවක් සහිත කැටයමක් පැරැණි බුරුමයෙන් ද (වර්තමාන මියන්මාරය) හමු වී ඇත. ආචාර්ය ඔස්කාර් සෞර්ට් පවසන පරිදි[2] තත් හතක් සහිත ලයර් (lyre) නැමැති තත් වාද්‍යය ක්‍රිස්තු පූර්ව යුගයේ ප්‍රචලිත ව පැවැති බව (මෙසපොටේමියා මිසර හා ග්‍රීක ශිෂ්ටාචාරවලින්) සාධක හමු වී ඇත.

හින්දු සාහිත්‍යයේ සඳහන් කරන වීණාව පිළිබඳ සාධක ද මෙහි දී විමසා බැලීම වැදැගත් වේ. 'වීණා' යන වචනය මුලින් ම හමු වන හින්දු සාහිත්‍ය මූලාශ්‍රයය වන්නේ ඍග්වේදය යි. එහි 'වාන' නැමැති වීණා විශේෂයක් ගැන සඳහන් වේ. එහි තත් සියයකි. එය ම අථර්වන් වේදයේ ද සඳහන් වේ. 'වීණා' යන්න මේ සංස්කෘත 'වාන්' (වාන් > වාන > වේනු > වීණා) ධාතුවෙන් උත්පාදනය වූ බව ද මතයක් පවතී. මේ 'වාන්' ධාතුවෙන් ශබ්දය, වේගය වැනි අරුත් විදහා පායි.

'මරුතඃ වානම් සත - සංඛ්‍යාභිස් - තන්ත්‍රීභිර් යුක්තම්
වීණා විසේසම් ධමන්තෝ වාදයන්තඃ'[3]

නාරදීය ශික්ෂාවෙහි (ක්‍රි.ව. පළමු වැනි සිය වස) නාරදමුනිගාත්‍ර හා දාරවී යනුවෙන් වීණා වර්ග දෙකක් පිළිබඳ සඳහන් කර ඇත. මේ ගාත්‍ර වීණාව සාම ගායනා සඳහා පසුබිම් වාදනයට යොදාගත් බව ද, දාරවී වීණාව ජාති රාග ගායනා සඳහා උපයෝගී කරගත් බව ද ඔහු සඳහන් කරයි.

'දාරවි ගාත්‍ර - වීණා ච ද්වෙ වීණෙ ගාන ජාතිසු
සාමික ගාත්‍ර - වීණාතු තස්යඃ ස්රුනුත ලක්සනම් //
ගාත්‍ර - වීණා තු සා ප්‍රොක්තා යස්යම් ග්‍යාන්ති සාමගාඃ /
(නාරදීය ශික්ෂා)

හින්දු සාහිත්‍යයේ සප්ත තන්ත්‍රී වීණා පිළිබඳ පළමු වැනි ලිඛිත සඳහන හමුවන්නේ භරතගේ නාට්‍ය ශාස්ත්‍රයේ (ක්‍රි.ව. දෙ වැනි සිය වස) ය.

'සප්ත තන්ත්‍රී භාවෙ චිත්‍ර විපන්චි නවතන්ත්‍රිකා /
විපන්චි කොණවාද්‍යා ස්‍යාත් චිත්‍රකාන්ගුලී - වාදනා //
(නාට්‍ය ශාස්ත්‍ර)

(තත් හතක් ඇති චිත්‍ර වීණාව ඇඟිලි තුඩින් වයයි. තත් නවයක් ඇති විපන්චි වීණාව කෝණ නැමැති උපකරණයෙන් වයයි.)

පිටල්කොරා සප්ත තන්ත්‍රී වීණාව කෝණ නැමැති උපකරණයෙන් වයන නිසා එය භරතගේ චිත්‍ර වීණාව නො වන බව අනුමාන කළ හැකි ය. භරත අනුව කෝණයෙන් වයන වීණාවට තත් නවයකි. ඒ නිසා එය ද පිටල්කොරා සප්ත තන්ත්‍රී වීණාවට සමාන යැ යි සිතීමට අවකාශ මඳ ය. මේ වීණාවල හැඩය පිළිබඳ වැඩි යමක් භරත සඳහන් කර නො තිබීම අපගේ අධ්‍යාසය තවදුරටත් නිශේධනය කරන්නේ ය.

තත් හතක් සහිත චිත්‍ර වීණාව ගැන මතංගමුනි (ක්‍රි.ව. සත් වැනි සිය වස) තම බ්‍රිහද්දේශී ග්‍රන්ථයේ සඳහන් කරයි. අභිනවගුප්ත,

රනකුම්භා, සාරංගදේව ඈ පශ්චාත් භරත යුගයේ ග්‍රන්ථකරුවන් ද වීණා ගැන සඳහන් කර ඇතත් සප්ත තන්ත්‍රී වීණාව හා එහි හැඩය පිළිබඳ වැඩි යමක් සඳහන් කර නැත.

ඉන්දියා දමිළ සංගම් සාහිත්‍ය යුගයට අයත් තිරුවලුවර් නැමැති කවියාගේ තුරුක්කුරල් ග්‍රන්ථයේ ද, ලන්ගේ අඩිගාල් රජුගේ සීලප්පදිකාරම් නැමැති ග්‍රන්ථයේ ද සඳහන් කෙරෙන 'යාල්' (Yaal or Yazh) නමින් හඳුන්වන තන්ත්‍ර වාද්‍යය හා(ර්)ප් ස්වරූපයට සමානකමක් දක්වයි. එනමුත් ඒ ග්‍රන්ථ ලියැවෙන්නේ ක්‍රි.පූ. 200 දී පමණ ය.

හින්දු සාහිත්‍යයේත්, අද්‍යතන දක්ෂිණ භාරතයේත් දක්නට ලැබෙන වීණාව තුම්බා සහිත ඍජු දණ්ඩකින් හා හිසෙහි මකර හිසක් සහිත (යාලි මුඛම්) වීණාවකි. කලාවට අධිපති සරස්වතී අතෙහි රඳන්නේ ද එවැනි වීණාවකි. පිටල්කොරා වීණාව පැරණි ඊජිප්තු, මෙසපොටේමියා, පර්සියා හා(ර්)ප් වාද්‍යයේ ආකෘතියට දක්වන සමානතාව අතිශය ප්‍රබල සාධකයකි.

බුරුමයෙන් ද එවැනි වීණාවක් හමු වීම අපගේ අවධානය හින්දු ආභාසයෙන් ඔබ්බට රැගෙන යන්නේ ය. පිටල්කොරා යනු බෞද්ධාගමික සිද්ධස්ථානයක් වීම මෙහි ඇති ප්‍රධාන ම විශේෂත්වය යි. බෞද්ධ සිද්ධස්ථානයක් ලෙස ගොඩනැගුණු පිටල්කොරා ගුහා කැටයම්වලට පෙර කී හැඩයේ සප්තතන්ත්‍රී වීණා සහිත කැටයම් පැමිණියේ ඉහත සාකච්ඡා කළ කවර සාධකය ආසක්ත වීමෙන් ද යන වග සොයා බැලීම මේ පර්යේෂණයේ මුඛ්‍ය අධ්‍යාසය වේ. 'වීණා' පිළිබඳ බෞද්ධ සාහිත්‍යයික මූලාශ්‍රය පිළිබඳ සොයා බැලීම ද මෙහි තවත් අරමුණකි.

පිටල්කොරා ගුහා පිළිබඳ මුල් ම සඳහන හමුවන්නේ 1853 දී ය. ජෝන් විල්සන් විසින් සිදු කරන ලද චෛත්‍ය හා විහාර ගුහා පිළිබඳ පර්යේෂණයෙහි 'පිටල්කොරා' ගැන නාමික ව සඳහන් වේ. Fergusson හා Burgess දෙ දෙනා ඔවුන්ගේ Cave Temple of India ග්‍රන්ථයේ පිටල්කොරා ගැන සඳහන් කර ඇත. 1883 දී රචනා වන Vide Archaeological Survey, West India – IV (London) නැමැති

ග්‍රන්ථයේ Report of the Buddhist Cave – Temples and their Inscriptions [4]යන අනුමාතෘකාව යටතේ පිටල්කොරා ඇතුළු ඉන්දියාවේ වෙනත් බෞද්ධ ගුහා පිළිබඳ තොරතුරු හෙළි කෙරේ.

පිටල්කොරා වීණා කැටයම් පිළිබඳ මුල් ම සඳහන හමු වන්නේ M.G. දික්ෂිත් (1941) විසින් රචනා කරන ලද Bombay Historial Society නැමැති ග්‍රන්ථයේ ය. ඔහු පිටල්කොරා ගුහාශ්‍රිත ස්ථාන තුනකින් වීණා සහිත කැටයම් සොයාගෙන තිබේ. ඔහු සඳහන් කරන පරිදි මේ කැටයම් ක්‍රි.පූ. දෙ වැනි සියවසේ පමණ ස්ථාපිත වී ඇත. ස්වාමි ප්‍රඥානානන්ද A History of Indian Music (1963) හා A Historical study of India Music (1981) යන ග්‍රන්ථ ද්වයයේ සප්ත තන්ත්‍රී වීණා කැටයම් හා පිටල්කොරා ගුහා පිළිබඳ පර්යේෂණාත්මක නිබන්ධන ඉදිරි පත් කර ඇත. එනමුත් පිටල්කොරා යනු බෞද්ධ සිද්ධස්ථානයක් ය යන වග හා බෞද්ධාගමික මූලාශ්‍රය සමඟ මේ වීණාව සැසැඳෙන්නේ කෙසේ ද යන වග ඔහුගේ අවධානයෙන් ගිලිහී ඇත. බෞද්ධ සාහිත්‍යයේ සඳහන් කරන තත් හතේ වීණාව භරත නාට්‍ය ශාස්ත්‍රයේ දක්වන 'චිත්‍ර වීණාව' බව ආචාර්ය ඨාකූර් ජයදේව සිං (1960)[5] මතයක් ඉදිරි පත් කර ඇතත් ඔහු ඒ පිළිබඳ තොරතුරු විශ්ලේෂණය නො කරයි.

වීණා සංකල්පය පිළිබඳ බෞද්ධ සාහිත්‍යයේ හමු වන සාධක පිළිබඳ මෙහි දී අපගේ අවධානය යොමු කළෙමු. බෙංගාලි බසින් රචිත ජාතක කතාවල එන මත්ස්‍ය, භේරිවාද, ගුත්තිල, කුස, විදුර පණ්ඩිත වැනි ජාතක කතාවල වීණා පිළිබඳ තතු හමු වේ.[6] ගුත්තිල ජාතකයේ ඉතා පැහැදිලි ව සප්ත තන්ත්‍රී වීණා පිළිබඳ සඳහන් වේ

'සප්තතන්ත්‍රි සුමධුර මෝහිනී වීණාරේ /
වාදන සිඛිල අන්තේවාසික ආමාර //

වීණා වාදකයකු ව සිට පැවිදි වූ සෝණ තෙරුනට බුදුන් වහන්සේ වීණාවේ තත් සුසර කිරීමේ ක්‍රමවේදය අළලා කමටහන් ලබා දුන් අයුරු ත්‍රිපිටකයේ සූත්‍ර පිටකයේ අංගුත්තර නිකායේ එන 'සෝණ සුත්ත' කතාවෙන් පැහැදිලි කෙරේ. ත්‍රිපිටකය පාළි භාෂාවෙන් ලියැවෙන්නේ වළගම්බා රජු සමයේ අලුවිහාරේ දී ය. (ක්‍රි.පූ. පළමු

වැනි සිය වස) මීට තදාසන්න කාලයේ පිටල්කොරා බෞද්ධ ගුහා ද ස්ථාපනය වී ඇත. වළගම්බා රජු සමය මහායාන බුදු දහම ප්‍රචලිත වීමේ ආරම්භක යුගය නිසා මේ වීණා සංකල්පය මහායානික බලපෑමෙන් ත්‍රිපිටකයට අන්තර්ගත වන්නට ඇතැ යි ද සිතීමට පිළිවන. තදාසන්න සමයේ භාරතයේ ස්ථාපිත මහායාන දර්ශනයේ බලපෑම නිසා පිටල්කොරා බෞද්ධ ගුහාවලට මේ සප්ත තන්ත්‍රී වීණා කැටයම් අන්තර්ගත වූවා විය හැකි ය. ශක්‍ර දෙවියන්ගේ වීණා වාදක වූ පංචසිඛ බුදුන් විසූ ගුහාවට පැමිණ තම වීණාව වැයූ බව ත්‍රිපිටකයේ සූත්ත පිටකයේ දීඝ නිකායේ සක්කපාන සූත්ත නම් කතාවෙහි සඳහන් වේ. මෙය ද පිටල්කොරා වීණා කැටයම් පිළිබඳ නිගමනවලට එළැඹීමට යම් සාධනීය උත්තේජනයක් සපයයි.

පිටල්කොරා ගෘහ නිර්මාණ කැටයම් විකාසනය වූ කාලයට අයත් ලංකාවේ අනුරාධපුර යුගයේ චිත්‍ර, මූර්ති, කැටයම්, ගුහා ආශ්‍රයෙන් (ලෝවාමහා ප්‍රාසාද වාමන රූප) වීණා වයන ගැහැනු - පිරිමි රූප හමු වී තිබේ.[6]

සීගිරි ගී අතර ද වීණා වයන කතුන් ගැන කියැවෙන ගීත හමු වේ. 'තන රන්මලී වෙණ අතිනි ගත් හො රන්වන් ලි'(19) (රන් මලකින් පියයුරු සාදා වීණාව අතින් ගත් ඒ රන්වන් ලිය)[7]

අනුරාධපුර යුගය දැඩි හින්දු බලපෑමට ගොදුරු නො වීමත්, බෞද්ධාගම සංක්‍රමණය වීමත්, එහි ව්‍යාප්ත වීමත් නිසා ඒ යුගයේ හමුවන මේ 'වීණා' සංකල්පය අත්‍යන්තයෙන් ම බෞද්ධ මූලාශ්‍රය ඇසුරින් ගොඩනැගුණු බව සිතීමට පිළිවන.

පිටල්කොරා ගුහා අංක හතරෙහි ඇති පෙර කී වීණා කැටයම්වලට පිටුපසින් ඇත්තේ පියාසර කරන කින්නර හා ගාන්ධර්වයන්ගේ කැටයම් ය. කින්නර හා ගාන්ධර්ව සංකල්පය වෛදික යුගයේ අතිශය විවේචනයට බඳුන් වූවකි. මේ කින්නර හා ගාන්ධර්ව දෙ පිරිස දෙවියන්ගේ සතුරන් (ඉතිහාසඥ ආර්.සී. දත් පවසන පරිදි) බව සඳහන් වේ. එසේ නම් පිටල්කොරා බෞද්ධ ගුහාශ්‍රිත කැටයම් හින්දු බලපෑමෙහි පරම ප්‍රතිඵලයකැ යි ප්‍රකාශ කිරීමට මේ කින්නර - ගාන්ධර්ව රූප ප්‍රබල උත්තේජන සපයන්නේ නැත.

පිටල්කොරා වීණාවේ හැඩය එය, හින්දු සංකල්පවල එන වීණාවේ ම දිගුවක් යැ යි පැවැසීමට අනුබල දෙන්නේ නැත. ඒ හැඩයේ වීණා හින්දු සාහිත්‍යයේ හමු නො වන අතර එවැනි හැඩය ගත් වාද්‍ය හමු වන්නේ පැරැණි ඊජිප්තු, මෙසපොටේමියා හා පර්සියා ශිෂ්ටාචාරවලිනි. මෙයින් පර්සියාව බෞද්ධාගම පැවැති රටකි. එවැනි හැඩයේ වාද්‍ය හමු වී ඇති පැරැණි බුරුමය (මියන්මාරය) බෞද්ධ රටකි. බෞද්ධ කාලයට පෙර පැවැති වීණාව හා(ර්)ප් ස්වරූපයේ වීණාවක් බව රතිලාල් එන්. මෙහෙතාගේ Pre – Buddhist India නැමැති ග්‍රන්ථයේ මෙසේ සඳහන් කෙරේ.

Old Veena was a harp without the Post. It had a hollowed belly – (Doni) covered with a board or stretched leather (Camma Pokkara). The hollowed belly was broader towards the back ...... an upstanding curved arm (Danda) ...... a little scroll like the head of a violin. It had 7 strings.[8]

මෙසපොටේමියා හා(ර්)ප් වාද්‍යය ක්‍රි.පූ. 3500 තරම් පැරැණි ය. SabbeKa (lower – chested harp) හා Psantrina Sunifouyah (upper – chested concord harp) යන දෙ වර්ගයට අයත් ඒ හා(ර්)ප් වාද්‍ය කෝණ (plectrum) ආධාරයෙන් වයා ඇත. මෙසපොටේමියා ශිෂ්ටාචාරයට අයත් සුමේරියන්වරුන්ගේ ඌර් පෞර රාජ්‍යය (ur) වර්ෂ 4500කට වඩා පැරැණි ය. ඌර් පෞර රාජ්‍යයෙන් සොයාගත් රාජකීය සුසානසර කැටයම් ඵලක ක්‍රි.පූ. 2550 පමණ කාලයට අයත් බව පුරාවිද්‍යාඥයන්ගේ මතය යි. ඌර් පෞර රාජ්‍යය වර්තමාන ඉරාකය ආසන්නයේ ප්‍රදේශයක පිහිටා තිබූ බව ඔවුන්ගේ අදහස යි.

කෙසේ වෙතත් මේ ඌර් රාජ්‍යයට අයත් සුසානසර කැටයම් ඵලක අතර හා(ර්)ප් වාදකයකුගේ කැටයම් හමු වේ. යුද්ධය හා සාමය නිරූපණය කරන ඵලක (war panel and peace panel) දෙකින් සාමය නිරූපිත ඵලකයේ මේ හා(ර්)ප් වාදකයාගේ කැටයම හමු වේ. මේ ඵලක ක්‍රි.පූ. 2600 දී පමණ නිර්මාණය වූ බව ගණන් බලා ඇති අතර ඒවා දැනට බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ තැන් පත් කොට ඇත.

ඊජිප්තු හා(ර්)ප් වාද්‍ය ක්‍රි.පූ. 1250 පමණ කාලයට අයත් ය. ඊජිප්තුවරු මේ හා(ර්)ප් වාද්‍යය 'බුනි' (Buni) නමින් හැඳින්වූ හ. තත් දෙකක් හෝ හතරක් සහිත ඊජිප්තු හා(ර්)ප් වාද්‍යය ද 'කෝණ' මඟින් වැයූ බවට සාධක ඇත. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ මේ ඊජිප්තු හා(ර්)ප් වාද්‍යය තැන් පත් කර ඇත. හා(ර්)ප් වාද්‍යය පැරණි පර්සියානුවන්ගේ ද ප්‍රධාන තත් වාද්‍යයකි. ඔවුහු එය Chang නමින් හැඳින්වූ හ. ක්‍රිස්තු පූර්ව යුගයට අයත්, හා(ර්)ප් වයන කාන්තාවන් සහිත චිත්‍ර පර්සියාවෙන් හමු වී ඇත.

යථෝක්ත සියලු සාධක විශ්ලේෂණය කර බැලීමේ දී පිටල්කොරා බෞද්ධ ගුහාශ්‍රිත සප්ත තන්ත්‍රි වීණාවේ ආකෘතිය හා විකාසනය හින්දු මූලාශ්‍රයේ සඳහන් වන වීණාවේ ස්වරූපයට වඩා පැරණි මෙසපොටේමියා, ඊජිප්තු, ග්‍රීක, රෝම, පර්සියා හා(ර්)ප් වාද්‍යයේ ස්වරූපයට දක්වන සමීපතාව ප්‍රබල ව ඉස්මතු වී පෙනේ. ඒ අනුව පිටල්කොරා සප්ත තන්ත්‍රී වීණාව ඉන්දියා හින්දු වීණාවේ ම තවත් දිගුවක් නො ව පෙර කී හා(ර්)ප් වාද්‍යයේ ආභාසයෙන් ගොඩනැගුණු නමුත් ඊට ම අනන්‍ය ආකෘතියක් දරන බෞද්ධ කාලීන වීණා විශේෂයක් බව නිගමනය කළ හැකි ය.

## ආන්තික සටහන්

1. Vide Archaeological Survey, West India – IV, 1883, London, pp. 11 – 12
2. Dictionary of Classical Antiquities – 1891
3. සෘග් වේදය, 10-32 4
4. Singh,Thakur jaidev, (1960) Historical Development Of India; Evolution and Development of Veena, pp.374-387
5. The Bengali version of the Jataka, translated by Isana Chandra Ghose, Calcutta
6. C. De S. Kulatillake, Ethnomusicological Aspects of Sri Lanka, 1991)
7. සීගිරි පද්‍යාවලිය, නන්දසේන මුදියන්සේ, 1963, පිටුව 163
8. Meheta, Ratilal.N.(1939) Pre-Buddhist india,p.313

## මූලාශ්‍රය නාමාවලිය


Bhattacharya, Tarapada. (1929) **Iconography of Buddhist and Brahmanical Sculpture in the Decca museum**. Decca.

Chandra Ghose, Isana. (trans.) (1853) **The Bengali version of the jataka** Calcutta.

Gustave, Reese. **Music in the middle Ages** (1940) New York: W.W. Norton and Company.

Jaidev Singh, Thakur. (1960) **Historical Development of Indian Music**.

Kasliwal, Suneera. (2001) **Classical Musical Instruments**. New Delhi: Rapa co.

Kulatillake, C.De.S. (1991) **Ethnomusicological Aspects of Sri Lanka**. Maradana: S.Godage and Brothers.

Prajnanananda, Swami. (1960) **Historical Development of Indian Music**. (1963) **A History of Indian music**. Calcutta. (1973) **Music of the Nations**. (1980) **A Historical study of Indian music**. New Delhi: Munshiram Manoharlal publishers.

Sayana, Acharya. (1810) **The Commentary on the Rgveda,Vide, The Rgveda Samhita,vols.i-vii**. (1895) **Atharvaveda-Samhita,vols.i-iv with the commentary**. Bombay.

Tagore, S.M. (1986) **Universal History of Music**. Calcutta.

**The Ancient India**, No.15, (1959) Published by the Archaeological survey of India.